මහරගම නගර සභාව

**කොළඹ දිස්ත්‍රික්කය**

-----------------------

**1.** මූල්‍ය ප්‍රකාශන

----------------

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 12 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මහරගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

**1.3.1** **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 හා 2017 වර්ෂවලට අදාළ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ආ) වාහන නැවැත්වීම සඳහා බදු දෙන ලද ඉඩම වෙනුවෙන් එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු සමඟ ලැබිය යුතු රු. 99,450 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වියදම් වෙනුවෙන් 2018 ජනවාරි සිට මාර්තු දක්වා ගෙවා තිබූ රු. 10,420,206 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) අවලංගු වී තිබූ කොන්ත්‍රාත් ගිවිසුම් 02 ක වටිනාකම වූ රු. 665,000 ක් ණයහිමි උපලේඛනයට ඇතුළත් කිරීම නිසා ණයහිමියෝ එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) රියදුරන් 18 දෙනෙකුගෙන් අයකරන ලද සේවක ඇප තැන්පත් රු. 90,000 ක් සේවක ඇප තැන්පත් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2** නොසැසඳුණු ගිණුම්

----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 14 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛන/ වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු. 53,668,753 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ලැබිය යුතු ගිණුම්

-------------------

(අ) 2012 වර්ෂයේ සිට පැවත එන මැතිවරණ රාජකාරි වෙනුවෙන් ලැබිය යුතු රු. 2,167 ක්, ලැබිය යුතු උපාධිධාරී අභ්‍යාසලාභී දීමනා රු. 20,000 ක් හා ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු. 14,868,518 ක් ප්‍රවර්තන වර්ෂයේදීත් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ආ) ආහාර සුරක්ෂාව වෙනුවෙන් හෝටල් හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා නගර සභාව වැයකර තිබූ රු. 246,615 ක මුදල 2018 මැයි දක්වා ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

--------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 48,148,393 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට වලට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය)165 වගන්තියේ "ඈ" උපවගන්තිය | 4,634,760 | නගර සභා පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් කට්ටිකර විකිණීමේ දී එම ඉඩමේ විකුණුම් වටිනාකමින් සියයට 1 කට සමාන බද්දක් විකුණුම්කරුගෙන් අයකර ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් විකුණුම් 10 කින් සභාව විසින් අය කර තිබුණේ ආදායම් පරීක්ෂක විසින් ඇස්තමේන්තු කරන ලද විකුණුම් වටිනාකමින් සියයට 1 ක් පමණි. මෙම ඇස්තමේන්තු වටිනාකම හා ඉඩම් කොටස්වල සත්‍ය විකුණුම් වටිනාකම අතර වෙනස සසඳා එම වෙනස අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මු.රෙ. 177 (1) | 442,873 | එකතු කරන ලද රජයේ මුදල් දිනපතා හෝ හැකිතාක් ඉක්මනින් තැන්පත් කළයුතු වුවද දේපළ තහනම් කිරීමේ නිලධාරින් විසින් එකතු කරන ලද හිඟ වරිපනම් ගාස්තු විශාල කාල පමාවක් සහිතව සභාවේ තැන්පත් කර තිබුණි. |
| (ii) | මු.රෙ. 188 (2) | 9,325 | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 01 ක් හා මුදල් ඇණවුම් 03 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| (iii) | මු.රෙ. 396 (ඇ) | 607,704 | නිකුත්කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ චෙක්පත් 65 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3:1 ඡේදය | - | සභාව සතු වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3:3 ඡේදය | 19,132,459 | කොන්ත්‍රාත් පිරිනමන අවස්ථාවේදී අදාළ ප්‍රජාපාදක සංවිධානය කොන්ත්‍රාත් 04 කට වඩා නිරත නොවිය යුතු වුවත් කොන්ත්‍රාත් පැවරීමේදී ඊට පටහැනිව කටයුතු කර තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 192,717,964 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.192,729,139 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

අංක 607629 දරන ජංගම ගිණුම 2015 අගෝස්තු මාසයේ දී වසා තිබුණද මුදල් යටතේ රු. 2,052,258 ක නාමික වටිනාකමක් සමාලෝචිත වර්ෂයේදී ද ගිණුමේ දක්වා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම (රු). 000' | බිල්කළ ආදායම (රු). 000' | රැස්කළ ආදායම (රු). 000' | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු). 000' | ඇස්තමේන්තු ගත ආදායම (රු). 000' | බිල්කළ ආදායම් (රු). 000' | රැස්කළ ආදායම (රු). 000' | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු). 000' |
| **i.** වරිපනම් හා බදු | 95,506 | 87,236 | 70,300 | 54,627 | 89,615 | 97,995 | 70,328 | 60,045 |
| **ii.** කුලි | 19,206 | 7,399 | 5,254 | 2,145 | 19,685 | 18,594 | 15,761 | 6,837 |
| **iii.** බලපත්‍ර ගාස්තු | 1,602 | - | 1,226 | - | 1,072 | 1,023 | 948 | 307 |
| **iv.**වෙනත් ආදායම් | 257,780 | - | 368,753 | - | 224,886 | 350,751 | 347,241 | 178,502 |

### 2.3.2 වරිපනම් හා බදු

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ වරිපනම් රු.84,270,534 ක් වුවද ඉන් රු.16,428,062 ක් හෙවත් සියයට 19 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.57,304,852 ක් වුවද ඉන් සමාලෝචිත වර්ෂය තුළ දී රු.19,230,383 ක් පමණක් අයකරගෙන තිබූ බැවින් රු.38,074,469 ක් හෙවත් සියයට 66 ක් හිඟව තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.54,502,531 ක් වූ අතර ඉන් රු. 50,000 ඉක්මවූ වරිපනම් ඒකක 41 කින් රු. 3,652,240 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

### 2.3.3 කුලී

2017 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 176 කින් රු. 4,220,613 ක මුදලක් අයවීමට තිබූ අතර ඉන් මාස 03 සිට මාස 97 දක්වා කාලපරිච්ඡේදයකට අදාළව කඩ කාමර 134 ක් වෙනුවෙන් රු. 4,102,367 ක් අයවීමට තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

**(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

(i) විමධ්‍යගත ආධාර යටතේ ක්‍රියාත්මක කළයුතු රු. 400,000 ක් වටිනා ව්‍යාපෘති 02 ක් අරමුදල් ප්‍රමාණවත් නොවීම හා වෙනත් ව්‍යාපෘතියකට අරමුදල් මාරු කිරීම යන හේතු දක්වමින් අවලංගු කර තිබුණි.

(ii) පොදු අරමුදල් යටතේ ක්‍රියාත්මක කළයුතු රු. 2,871,115 ක් වටිනා ව්‍යාපෘති 04 ක් විරෝධතා මතුවීම, වෙනත් ව්‍යාපෘතියකට අරමුදල් මාරු කිරීම, කාලගුණික හේතු හා පවරා ගැනීම් සම්පූර්ණ නොවීම යන හේතු දක්වමින් අවලංගු කර තිබුණි.

(ආ) **කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

(i) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් රු. 9,500,000 ක් වටිනා ව්‍යාපෘති 05 ක වැඩ අවසන් කර නොතිබුණි.

(ii) පොදු අරමුදල් යටතේ ක්‍රියාත්මක කළ රු. 55,079,556 ක් වටිනා ව්‍යාපෘති 41 ක් කාලගුණික හේතු හා ගිවිසුම්ගත කාලසීමාව නොඉක්ම වීම හේතුවෙන් වැඩ අවසන් කර නොතිබුණි.

(iii) පැපිලියාන ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා 2012 සිට 2017 වර්ෂය දක්වා පළාත් සභා අරමුදලින් හා සභා අරමුදලින් රු. 14,401,828 ක් වැය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සංවර්ධන කටයුතු අවසන් කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

(i) 2017 වර්ෂය තුළ වෙන්කරන ලද කසළ ටොන් 2,340 ක් හා වෙන් නොකරන ලද කසළ ටොන් 31,827 ක් කරදියාන කසළ අංගනයට භාරදී තිබුණු අතර වෙන්කරන ලද කසළ ප්‍රමාණය වෙන් නොකරන ලද කසළ ප්‍රමාණයෙන් සියයට 7.3 ක් විය. කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය නොකිරීම නිසා රු. 23,870,250 ක් වැඩිපුර ගෙවීමට සභාවට සිදු ව තිබුණි.

(ii) කසළ ප්‍රවාහනය සඳහා සභාවට අයත් වාහන 38 ක් තිබියදී පෞද්ගලික ආයතන 04 කින් ප්‍රවාහන සේවා ලබා ගැනීම වෙනුවෙන් 2017 වර්ෂය තුළ රු. 998,850 ක් ගෙවා තිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) අගරු චෙක්පත්

ගනුදෙනුකරුවන් විසින් වරිපනම් ගෙවීම සඳහා ලබා දී තිබූ රු. 15,698 ක් වටිනා චෙක්පත හා දැන්වීම් පුවරු ගාස්තු වෙනුවෙන් ලබා දී තිබූ රු.212,472 ක් වටිනා චෙක්පත් 03 ක් අගරු වී තිබුණ ද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **විථී පහන් නඩත්තුව**

-----------------------

2017 වර්ෂය තුළ විදුලි බුබුලු 7369 ක් ගබඩාවෙන් නිකුත්කර තිබුණද කණු අංකනය නොකිරීම හා ලේඛන විධිමත්ව නඩත්තු නොකිරීම නිසා වර්ෂය තුළ සවිකළ වීථි පහන් සංඛ්‍යාව නිවැරදිව හඳුනාගත නොහැකි වූ අතර විදුලි බුබුළුවල වගකීම් කාලය ද ප්‍රශ්නගත විය.

(ඇ) **එකතුකළ අගය මත බදු**

---------------------------

එකතු කළ අගය මත බදු (VAT) ගිණුම්තැබීම නිවැරදි නොවීම හේතුවෙන් රු. 10,853,753 ක ලැබිය යුතු ශේෂයක් ගිණුම්වල පෙන්වා තිබූ අතර මෙම ගනුදෙනු නිරාකරණය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

**(අ)** 2017 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සේවක සංඛ්‍යාව** | **අතිරික්ත සේවක සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 03 | 02 | - |
| තෘතීයික මට්ටම | 02 | 01 | 01 | - |
| ද්විතීයික මට්ටම | 90 | 75 | 15 | - |
| ප්‍රාථමික මට්ටම | 287 | 269 | 18 | - |
| වෙනත් | - | 30 | - | 30 |
| එකතුව | 384 | 378 | 36 | 30 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 36 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි. එමෙන්ම වෙනත් (අනියම්, ආදේශක, තාවකාලික) තනතුරු 30 ක් අතිරික්තව පැවතුණි.

(ii) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක පුරප්පාඩු පැවතිම හේතුවෙන් සභාවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කිරිමට නොහැකි වී තිබුණි.

(iii) 2014 නොවැම්බර් 12 දිනැති හා අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව බඳවාගෙන ස්ථිර පත්වීම් ලබාදී තිබූ සේවකයකු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොකිරීම නිසා එම සේවකයා සඳහා ගෙවන ලද වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වි තිබුණි.

(ආ) සේවක ණය

------------

මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට හිඟ සේවක ණය ශේෂය රු.35,414,692 ක් වුවද ඉන් 1988 සිට 2017 දක්වා කාලපරිච්ඡේදයට අදාළව සේවය හැර ගිය, ස්ථාන මාරු වී ගිය හා මිය ගිය සේවකයන් 39 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,515,167 ක ණය ශේෂය අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දේපල වර්ෂ 5 කට වරක් තක්සේරුකර වරිපනම් බදු අයකිරීම කළ යුතු වුවද 2008 වර්ෂයෙන් පසු දේපළ තක්සේරු කර නොතිබුණි.

(ආ) බදු ගිවිසුම අනුව බදුකරු මාස 06 කට අධික කාලයක් කුලී ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් කුලී ගිවිසුම ඒකපාර්ෂිකව අවලංගු කිරීමේ බලය නගර සභාව සතු වුවත් මාස 06 සිට මාස 97 ක් දක්වා කුලී ප්‍රමාද වූ කඩ කාමරවල කුලී ගිවිසුම් අවලංගු කර එම කඩ කාමර නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර නියමිත දිනට කුලිය නොගෙවන අවස්ථාවලදී සියයට 10 ක දඩ මුදල ද අයකර නොතිබුණි.

(ඇ) නගර සභාවට අයත් ගොඩිගමුව මල් ශාලාව බදු දීමේ ගිවිසුමේ 8:1 වගන්තිය අනුව මෘත දේහයක් මල් ශාලාවේ තබන දින ගණන් මත අයකරනු ලබන මුදලින් නගර සභාවට අයවිය යුතු මුදල් අයවී නොතිබුණි.

(ඈ) සභාව විසින් නඩත්තු කරනු ලබන වීථි පහන්, ඒවා පිහිටා ඇති මාර්ග හා අංකනය කරන ලද වීථි පහන් කණු පිළිබඳව විස්තර දැක්වෙන ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

----------------------------

3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

---------------------------------

(අ) නගර සභාව විසින් ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයක් නඩත්තු නොකිරීම නිසා 2015 හා 2016 වර්ෂවල මිනුම් කරන ලද සුසානභූමිවල වපසරියේ නිරවද්‍යතාවය තහවුරු නොවූ අතර සුසානභූමිවල අයිතිය තහවුරු කර ගැනීමට අදාළ ඔප්පු හෝ පැවරුම් ලිපි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ඉන්වෙන්ට්‍රි ලේඛන විධිමත්ව පවත්වාගෙන නොතිබූ අතර බාහිර පාර්ශවයන්ගෙන් සභාවට ලද පරිත්‍යාග ලේඛනගත කර නොතිබුණි.

3.5.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

-------------------------------------------

සභාවේ ඇති කොඩි කණු බාහිර පාර්ශවයන්ට නිකුත් කිරීමේදී හා ආපසු ලැබීමේදී ඒවා ලේඛනගත කිරීමක් සිදුකර නොතිබුණි.

3.5.3 පවරා නොගත් වත්කම්

-------------------------

(අ) හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් 2002 වර්ෂයේ මහරගම නගර සභාවට ලබාදී තිබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ට්‍රැක්ටර් 02 ක් සහ ට්‍රේලරයක් සභාවට පවරාගෙන නොතිබුණි.

(ආ) බස්නාහිර පළාත් පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2017 මැයි 23 දින සභාව වෙත ලබා දී තිබූ රු.535,000 ක් වටිනා ජල බවුසරය සභාවට පවරා ගෙන නොතිබුණි.

3.5.4 නිශ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

(අ) 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව අපහරණය කළ යුතු බවට නිර්දේශ කළ වාහන 02 ක් අපහරණය කර නොතිබුණි.

(ආ) ගර්හිත තත්වයේ පවතින ට්‍රැක්ටරයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5.5 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

---------------------------------------

ප්‍රවර්තන වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අනුව අතිරික්තතා/ ඌනතා විධිමත් පරිදි සටහන් කර ඒ පිළිබඳ අවසාන වාර්තාවක් සකස් කර නොතිබුණි.

3.5.6 වාහන උපයෝජනය

-----------------------

පාවිච්චි කළ ඉන්ධන ප්‍රමාණය හා ගමන් කළ දුර දෛනික ධාවන සටහන්වල ඇතුළත් කර නොතිබු අතර ලොග් සටහන් පොත් විධිමත්ව පවත්වා ගෙන නොතිබුණි.

3.6 **හඳුනාගත් පාඩු**

**-----------------**

(අ) 2010 සිට 2017 දක්වා වූ කාලසීමාව තුළ සාමාජිකයන් 122 කට නිකුත් කළ රු. 51,672 ක් වටිනා පුස්තකාල පොත් 189 ක් ආපසු භාරදී නොතිබුණි.

(ආ) සභාව සතු වාහනයක් 2017 නොවැම්බර් 03 දින අනතුරකට ලක් වී තිබූ අතර ප්‍රාරම්භක වාර්තාව අනුව එහි අලාභයේ ඇස්තමේන්තු වටිනාකම වූ රු.500,000 මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

4. **ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**------------------------------------**

4.1 **අයවැය පාලනය**

**------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම්වල සියයට 0.65 සිට සියයට 352.66 දක්වා විචලනයන් පැවති අවස්ථා 17 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) අයවැයගත ප්‍රතිපාදන රු.24,822,000 ක් වූ වියදම් ශීර්ෂ 147 කින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වියදමක් දරා නොතිබුණි.

4.2 **අභ්‍යන්තර විගණනය**

**-----------------------**

අභ්‍යන්තර විගණන අංශයේ පරමාර්ථ හා කාර්යයන් ඉටුකරගත හැකි පරිදි කටයුතු විධිමත්ව සංවිධානයකර නොතිබුණු අතර ආයතනයේ මුදල් හා පරිපාලන කටයුතුවලින් නිදහස් වූ ඒකකයක් ලෙස ක්‍රියා කිරීමටත් අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමටත් කටයුතු කර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/1 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු වුවත් 2017 වර්ෂය සඳහා රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර ලේකම්වරයාගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. ගිණුම්වල වැඩියෙන් සටහන් කිරීම් තිබීම.<br>ii. ගිණුම්වලින් අත්හැරීම් සිදුවී තිබීම. |
| (ආ) ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් නිසි පරිදි අය නොකිරීම.<br>ii. බදු තක්සේරු නිසි කලට සිදු නොකිරීම. |
| (ඇ) අයවැය පාලනය | i. ආදායම් ඇස්තමේන්තු තාත්වික බවකින් යුතුව පිළියෙළ නොකිරීම.<br>ii. ආදායම් හා වියදම් විෂයයන්වල සැලකිය යුතු විචලනයන් තිබීම. |
| (ඈ) ස්ථාවර වත්කම් හා තොග පාලනය | i. ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම.<br>ii. තොග ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම.<br>iii. නිසි පරිදි තොග සමීක්ෂණ කටයුතු සිදු නොකිරීම. |
| (ඉ) ණයගැති, ණයහිමි පාලනය | i. ශේෂ සනාථ කිරීම් ප්‍රමාණවත් පරිදි සිදු නොකිරීම.<br>ii. හිඟ ශේෂ නිරවුල් නොකිරීම. |
| (ඊ) අභ්‍යන්තර විගණනය | i. අභ්‍යන්තර විගණනය විධිමත් නොවීම.<br>ii. අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම. |